## 21. ශීර්ෂය 21 - විගණකාධිපති

---------------------------------

### 21.1 විගණන විෂය පථය

----------------------

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අප්‍රේල් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 21.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

--------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 21.3 විගණන නිරීක්ෂණය

----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ

සහ පහත 21.4 සහ 21.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

--------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.2,578,513 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83 ක සිට සියයට 92 ක් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) ආදායම් ගිණුම

------------------

(i) ඉදිරිපත් කළ ගිණුමට අනුව රු.193,085,717 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුනි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනට පැවැති එකතුව රු.162,699,335 ක් වූ හිඟ ආදායම් ප්‍රමාණය සමඟ 2012 දෙසැම්බර් 31 දිනට පැවැති එකතුව රු.193,085,717 ක් වූ හිඟ ආදායම් ප්‍රමාණය සසඳන විට රු.30,386,382 කින් එනම් සියයට 18.68 කින් වැඩි වී තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

------------------------------------------------------------------------

විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශ ප්‍රකාර එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,342,900 ක් විය.

**21.4 අනුකූල නොවීම**

**-------------------**

ඇතැම් ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් අංක 264 (1) දරන මුදල් රෙගුලාසියෙන් සහ 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අනුව ක්‍රියා නොකිරීම් නිරීක්ෂණය විය.

## 21.5 මානව සම්පත් කළමනාකරණය

**---------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**--------------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 355 | 175 | 180 |
| (ආ) | ද්විතීයික මට්ටම | 1214 | 907 | 307 |
| (ඇ) | තෘතීයික මට්ටම | 178 | 143 | 35 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 181 | 125 | 56 |
| | එකතුව | 1928 | 1350 | 578 |